## මැතිවරණ නීති උල්ලංඝනය සහ අදාළ ප්‍රචණ්ඩ ක්‍රියා හා බැඳුනු ආසන්නතම

## සිද්ධි දහය (10)

- ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමට ආසන්න කාලයේ එනම් 2014 නොවැම්බර් 18 වන දින පොලිස් නිලධාරීන් 350 දෙනෙකු මාරුකිරීම
- 2014 නොවැම්බර් 14 වන දින පොදුජන එක්සත්පෙරමුණේ අකුරැස්සේ මැතිවරණ වේදිකාව සැරසීම සඳහා බන්ධනාගාරගත සිරකරුවන් යොදා ගැනීම
- පොදුජන එක්සත් පෙරමුණේ ජනාධිපති අපේක්ෂකගේ මැතිවරණ පෝස්ටර් ඇලවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් යොදා ගැනීම
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වඳුරඹ මැතිරණ වේදිකාව ගිනි තැබීමේ චෝදනාව යටතේ පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවන් තිදෙනෙකු පොදුජන එක්සත් පෙරමුණේ නියෝජ්‍ය ඇමැතිවරයෙකු බලහත්කාරයෙන් පැහැරගෙන තිබේ. පසුව එම සැකකරුවන් නියෝජ්‍ය ඇමැතිවරයාගේ වාහනයෙන් බද්දේගම මහේස්ත්‍රාත් වෙත ගෙනයන ලදුව 2014 දෙසැම්බර් මස 29 දින දක්වා රක්ෂිත බන්ධානාගාර ගත කෙරිනි. මෙයසිදුවූයේ 2014 දෙසැම්බර් මස 19 වන දින දීය.
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වීථි නාට්‍ය කණ්ඩායමට හම්බන්තොට දී පහරදෙන ලදී. ගිනි අවි දරා සිටි ප්‍රහාරකයින් නාට්‍යකරුවන්ට තර්ජනය කර පහර දී තිබේ. නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයන් දෙදෙනෙකු රෝහල්ගත කෙරිනි. මෙය සිදුවූයේ 2014 දෙසැම්බර් 21 දින දී යි.
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මැතිවරණ ව්‍යාපාරයට සහයෝගය දක්වීම සඳහා දෙසැම්බර් 20 වන දින හපුතලේ පැවැති එක්සත් ජාතික පක්ෂ රැස්වීමකට පහරදෙනු ලැබූ අතර පසුව එය වීථි සටනක් දක්වා වර්ධනයවිය. රැස්වීමකට පහරදෙනු ලැබූවන් පොලිස් නිලධාරීන් පසුපස සිටිනවා මාධ්‍ය ඡායාරූප තුළින් ප්‍රදර්ශනය විය.
- එක්සත් ජනතා නිදහස් සන්ධානයට සම්බන්ධ යැයි සැකකෙරෙන වෙඩි තැබීම් හයක් (6) වාර්තා වේ. මෙයින් එකක් මග්ගොනින්ද දෙකක් පුත්තලමේ මාදම්පෙන්ද එකක් මහනුවරින් එකක් බදුල්ලෙන්ද එකක් අනුරාධපුරයෙන්ද වාර්තාවිය.
- ජනාධිපති මැතිවරණය ඉලක්ක කර රාජ්‍ය සුභසාධක වැඩසටහන් දියත් කෙරිනි. මේවා අතර ප්‍රධාන වැඩසටහන් වන්නේ.
    - o දිවයිනපුර විසිරී සිටින සමෘද්ධිලාභීන් වෙත විශේෂ සමෘද්ධි දීමනා ලබාදීම
    - o ගාල්ලේ නව සමෘද්ධිලාභීන් වෙත සමෘද්ධි කාඩ් බෙදාදීම
    - o ත්‍රිකුණාමලය සහ සේරුවාවිල ගොවීන් වෙත නියං සහනාධාර බෙදාදීම
    - o පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවියන් වෙත බිත්තර වී බෙදාදීම
    - o මහන මැෂින් සහ කෘෂිකාර්මික උපකරණ උතුරු පළාතේ බෙදීම
    - o ගාල්ලේ රත්ගම ප්‍රදේශයේදී මුලුතැන්ගෙයි උපකරණ බෙදාදීම
- මැතිවරණ කොමසාරිස්වරයාගේ මැදිහත්වීමෙන් අනතුරුව රාජ්‍ය සේවකයින් වෙත දෙසැම්බර් මාසය තුළදී ජංගම දුරකථන බෙදාදීමට යොදා තිබූ වැඩපිළිවෙල තාවකාලිකව අත්හරින ලදී.
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයාට සහ ඔහුට සහය පලකරන පක්ෂවලට මැතිවරණ රැස්වීම් පැවැත්වීම සඳහා ප්‍රසිද්ධ ස්ථාන ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. එසේ ප්‍රසිද්ධ ස්ථාන ලබාදීම ප්‍රතික්ෂේප කළ පොදුජන එක්සත් පෙරමුණේ පාලනයෙන් යුතු පළාත් පාලන ආයතන කිහිපයක් වන්නේ.
    - o අකුරැස්ස ප්‍රාදේශීය සභාව
    - o රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
    - o දෙහිඕවිට ප්‍රාදේශීය සභාව
    - o බදුල්ල මහ නගර සභාව

